# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,506—1958 අගෝස්තු 29 වැනි සිකුරාදා—29.8.1958**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 2477 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 2477 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 2477 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 2479 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 2479 |
| මිළ පාලන දැන්වීම .... .... .... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 2480 |
| " සුරාබදු ආඥපණත " පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1958 අංක 371**

ඩීඊජී—අංකය : ඩී. 2/රෙක්ට්/14.

**රාජකීය ලංකා නාවුක හමුදව—පත්කිරීමක්**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත සඳහන් කරන ලද මහතා 1958 සැප්තැම්බර් මස 1 වැනි දින සිට, රාජකීය ලංකා නාවුක හමුදවේ කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත්කිරීම සහ උපදේශක ලෙප්ටිනන්ට් තනතුරට උසස් කිරීම අනුමත කොට තිබේ :—

වේලතන්ත්‍රීගේ විජයපාල හියුබර්ට් බොතේජු.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 අගෝස්තු මස 18 දින.

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 372**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ඇත්තේය :—

ඒ. 216/57.

ඒ. වී. රිචඩ්ස් මහතා 1957 ජූලි මස 17 වැනි දින පටන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම) වශයෙන්.

ඒ. 15/57.

ඩී. ඇම්. රත්නතුංග මහතා 1957 ජූලි මස 26 වැනි දින පටන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) වශයෙන්.

ඒ. 194/57.

උප කොමසාරිස් (නීති උපදේශක) අයි. ඒ. සී. ප්‍රනාන්දු මහතා ස්වකීය රාජකාරි වලට අතිරේක වශයෙන් 1958 ජූනි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ධුරයේ කටයුතු වල යෙදීමට.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958වේ අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ 1, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේදීය.
තැ. පෙ. 500.

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 373**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේ එස් සී. පීපී. 6/58.

ඩබ්ලිව්. තල්ගොඩපිටිය මහතා 1958 අගෝස්තු 10 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, මහනුවර දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේ එස් සී. පීපී 6/58.

වී. මානිකවාසගර් මහතා 1958 අගෝස්තු 10 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හාදුම්බර අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේ ඒ ඒ. 2/48.

එස්. ආර්. විජේයතිලක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 අගොස්තු 19 වැනි දින, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 7,958, 7,452 හා 8,249 නඩුවල තීන්දුව දීමට හා 1958 අගෝස්තු 23 වැනි දින, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 5,015 හා 7,386 නඩු ඇසීමට, අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ එස් සී. පීපී. 7/58.

පී. මාරපන මහතා 1958 අගෝස්තු 10 වැනි දින පටන් 14 වැනි දින දක්වා මහනුවර, මාතලේ උසාවියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ හා මාතලේ මහෙස්ත්‍රාත් ධුරයේ හා රික්වැස්ට් කොමසාරිස් ධුරයේ වැඩ බැලීමට හා 1958 අගෝස්තු 15 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, මහනුවර, මාතලේ උසාවියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මාතලේ මහෙස්ත්‍රාත් ධුරයට හා රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේ ඒ ඒ 29/48.

පී. මාරපන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 අගෝස්තු 27 වැනි දින, මහනුවර දිස්ත්‍රික් උසාවියේ අංක එල්. 4,219, එල්. 4,974, එම් ආර්. 6,961 හා පී. 4,830 නඩුවල තීන්දුව දීමට මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ ඒ. ඒ 5/48.

ඊ. ශ්‍රී ස්කන්ද රාජ මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 සැප්තැම්බර් 6 වැනි දින, කයිට්ස් මහෙස්ත්‍රාත් උසාවියේ අංක 7,677 නඩුව ඇහීමට, කයිට්ස් අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේ ඒ ඒ.5/48.

එස්. එස්. කුලතිලක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 අගෝස්තු 29 වැනි හා 30 වැනි දිනයන්හි, හා 1958 සැප්තැම්බර් 1 වැනි දින, බදුල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 14,853, 12,570, 11,408, 8,970 නඩු, බදුල්ල-හල්දුම්මුල්ල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 28,874, 28,481, 28,157 හා 26,912 නඩු ඇහීමට, බදුල්ල–හල්දුම්මුල්ල අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ ඒ ඒ. 39/48.

ඊ. ඇෆ්. ද සිල්වා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 සැප්තැම්බර් 1 වැනි හා 2 වැනි දිනයන්හි, මන්නාරමේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 18,497 නඩුව ඇහීමට, මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා මන්නාරමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ ඒ ඒ. 19/48.

ඒ. වෛත්‍යලිංගම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 අගෝස්තු 29 වැනි දින ගාල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 3,418 නඩුවේ තීන්දුව දීමට හා ගාල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක ජේ. 6,199 හා ජේ. 6,198 නඩු ඇහීමට ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ ඒ ඒ. 53/48.

එච්. ආර්. පීරිස් මහතා 1958 අගෝස්තු 23 වැනි දින, රත්නපුරේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 63,673ඒ, 63,675ඒ, 64,164 නඩු හා රක්වානේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 61,502ඒ නඩු ඇහීමට රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ එල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එලයතම්බි මහතා 1958 අගෝස්තු 13 වැනි දින පටන් 25 වැනි දින දක්වා, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා යාපනේ මල්ලකම් උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ එල්. 33ඒ/53.

වී. කේ. කන්දසාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. නටරාජ මහතා 1958 අගෝස්තු 22 වැනි දින හා නැවතත් 23 වැනි දින පටන් 31 වැනි දින දක්වා, අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේ එල්. 59ඒ/56.

ජී. ඇම්. ඇෆ්. සිරිවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක්කරන තුරු ටී.බී. යටවර මහතා 1958 අගෝස්තු 15වැනි දින පටන් 18වැනි දින දක්වා, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ, එල්. 29ඒ/53.

සී. ඊ. ජයවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. පී. ජී. පෙරේරා මහතා 1958 අගෝස්තු 29 වැනි දින, ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේ. එල්. 1ඒ/48.

ජී. ඇස්. පී. අබේවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ආර්. පීරිස් මහතා 1958 අගෝස්තු 29 වැනි දින රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ ඒ ඒ. 40/48.

බී. ආර්. ජී. විජේයකෝන් මහතා 1958 සැප්තැම්බර් 4 වැනි දින, මාතලේ දිස්ත්‍රික් උසාවියේ අංක එල්. 652 නඩුවේ තීන්දුව දීමට, මහනුවර, මාතලේ උසාවියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ. එල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා 1958 අගෝස්තු 17 වැනි දින කුරුණෑගල අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කුරුණෑගල, කනදුල්ලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ ඒ ඒ. 49/48.

එම්. එඹුරපාඩම් මහතා 1958 සැප්තැම්බර් 3 වැනි දින, පේදුරු තුඩුවේ දිස්ත්‍රික් උසාවියේ අංක 5,537 නඩුවේ තීන්දුව දීමට, පේදුරු තුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ ඒ ඒ. 30/48.

බී. ආර්. ජී. විජේයකෝන් මහතා 1958 අගෝස්තු 20 වැනි දින, තෙල්දෙනියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 1,855 නඩුවේ තීන්දුව දීමට දුම්බර, තෙල්දෙනියේ උසාවියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : පී එල්/එස්. 10/53.

ඇම්. සමරක්කොඩි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඒ. සී. ද සිල්වා මහතා 1958 අගෝස්තු 14 වැනි හා 20 වැනි දිනයන්හි, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, සල්පිටි කෝරලේ හා කොළඹ ආදායම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශයේ, ගම්බද උසාවියේ, සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී එල්/ටී. 1/48.

ඇෆ්. ඩබ්ලිව්. තල්දෙන මහතා නැති අතර, ටී. ශ්‍රී පද්මනාදන් මහතා 1958 අගෝස්තු 15 වැනි දින, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ හා වැල්ලවාය ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී එල්/පී. 1/48.

ආර්. පරමකුරු මහතා නැති අතර, ඇ–ජ්. ඇස්. පෝල් මහතා 1958 අගෝස්තු 21 වැනි දින මන්නාරම් දිස්ත්‍රික්කයේ, මන්නාරම් ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී එල්/එම්. 7/56.

එන්. වී. ටී. මැන්දිස් මහතා නැති අතර, එස්. එච්. අබ්දුල් කාදර් මහතා 1958 අගෝස්තු 29 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට,

අංකය : පී එල්/එම්. 3/48.

එච්. මීදෙණිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඇෆ්. ජී. බී. පෙරේරා මහතා 1958 අගෝස්තු 26 වැනි හා 27 වැනි දින යන්හි, කෑගලු දිස්ත්‍රික්කයේ, බෙලිගල්, පරනකුරු, ගල්බඩ හා කිණිගොඩ කෝරළයන්හි ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී එල්/ඩබ්ලිව්. 10/53.

ටී. බී. වැත්තෑව මහතා නැති අතර ඩී. පෙරේරා මහතා 1958 අගෝස්තු 16 වැනි දින, නුවර එළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ හා වලපනේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958 අගෝස්තු 20 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ.අංකය 573, කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

## 1958 අංක 374

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගු වේ :—

අංකය : 74/2/81 (එම්. එෆ්).

කේ. වී. එස්. කදිරගාමනාදන් මහතා 1958 අගෝස්තු මස 9 වැනි දින පටන් කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට එකී දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තවරයා වශයෙන් කටයුතු කිරීමට.

අංකය : 74/2/79 (එම්.එෆ්).

එස්. තිල්ලියාර් මහතා 1958 ජූලි මස 30 වෙනි දින පටන් මාතලේ පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කායඝාල සහකාර වශයෙන්

එස්. එෆ්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1958 අගෝස්තු මස 22 වෙනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 1.

---

## 1958 අංක 375

අංක. ඕ.ඇම්.4/1/11.ඇෆ්.

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරු කිරීම පහත දැනුම් දී ඇති දිනයේ සිට බලපැවැත්වේ :—

1958 අගෝස්තු මස 4 වැනි දින සිට නැවත නියම කරන තුරු ලංකා විදේශ සේවයේ පස්වැනි පෙළේ වයි. යෝගසුන්දරම් මහතා වොෂින්ටන්හි ලංකා මහකොමසාරිස් කායඝාලයේ දෙවැනි ලේකම් හැටියට.

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ 1,
උත්තර මන්ත්‍රී මන්දිරය.

---

## 1958 අංක 376

අංකය : ඕඇම්. 4/1/11 ඇෆ්.

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරුකිරීම පහත දැනුම් දී ඇති දිනයේ සිට බල පැවැත්වේ :—

1958 ජූලි මස 28 වැනි දින සිට, නැවත නියම කරනතුරු ලංකා විදේශ සේවයේ පස් වැනි පෙළේ ඒ. පත්මරාජා මහතා ඔටාවාහි ලංකා මහ කොමසාරිස් කායඝාලයේ දෙවැනි ලේකම් හැටියට.

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 අගෝස්තු මස 20 දින,
කොළඹ 1, සෙනේට් මන්දිරයේදීය.

---

## 1958 අංක 377

අංකය : ඒ. සී. 4/5/57.

දිව්රුම් සම්බන්ධ ආඥපණතේ 12 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1958 අගෝස්තු මස 19 වෙනි දින සිට ඇල්. ඩබ්ලිව්. ඇම්. අබේසේකර මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයෙකු වශයෙන් පත්කර ඇත්තේය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1958 අගෝස්තු මස 16 වෙනි දින සිට පී. එල්. පැට්රික් මහතා නැවත වැඩ භාරගන්නාතුරු මඩකලපු දිස්ත්‍රික්කයේ අක්කරෙයි පත්තුවේ ආදායම් පාලක ධුරයෙහි වැඩබලන කාලයතුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ජේ. එම්. සභාරත්නම් මහතා ද

1958 අගෝස්තු මස 19 වෙනි දින සිට මාතලේ දිස්ත්‍රික්කයේ ඉනාමළුව කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයට සහ වගපනහ පල්ලේ සියපත්තුවේ අතිරේක හදිසි මරණ පරීක්ෂක ධුරයට කේ. ඩී. එම්. කරුණාරත්න මහතාද

1958 අගෝස්තු මස 27 වෙනි දින සිට එම්. බී. විජේකෝන් මහතා නැවත වැඩ භාරගන්නාතුරු බදුල්ල දිස්ත්‍රික්කයේ කුඹල්වෙල කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට කේ. පී. එස්. විජේතුංග මහතාද

පත්කර ඇත්තේය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1958 අගෝස්තු 25 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

---

## 1958 අංක 378

ජෝශප් බර්ට්‍රැම් පුවිමානසිංහ මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ දීය.

---

# ආණ්ඩුවේ නිවේදන

## තැපැල් සහ ආදයම් මුද්දර—භාෂාව වෙනස් කිරීම

පහත සඳහන් වර්ගවලට අයත් මෙහි පහත දක්වා ඇති භාෂා වෙනස් කිරීම් සහිත මුද්දර 1958 ඔක්තෝබර් මස 1 වෙනිද සිට විකිණීම සඳහා නිකුත් කරන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරණු ලැබේ :—

| | | | |
|---|---|---|---|
| ශත | 5 | ... | පොළොන්නරුවේ කිරිවෙහෙර |
| ශත | 10 | ... | තැඹිලි |
| ශත | 15 | ... | වෙසක් මල |
| රු. | 1 | ... | මැදිරිගිරියේ නටබුන් |

2. (අ) ශත 10 මුද්දරයේ දක්වෙන " Postage and Revenue " යන්න " තැපැල් ගාස්තු හා ආදයම් " යනුවෙන් සිංහලයෙන් දක්වෙනවා ඇත.

(ආ) හැම මුද්දරයකම නම සිංහලයෙන් වෙයි.

(ඇ) මුද්දරවල මිල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසියෙන් වෙයි.

(ඈ) " ශ්‍රී ලංකා " යන්න ප්‍රමුඛ වශයෙන් දක්වෙයි. ඊළඟට ක්‍රමයෙන් " இலங்கை " යන්නත් " Ceylon " යන්නත් දක්වෙයි.

3. මෙ මුද්දරවල පාට, ප්‍රමාණය සහ සිදුරු තැබීම වෙනස් නොවේ. මෙ වර්ගවලට අයත් දනට පාවිච්චි වෙන මුද්දර තොග අවසන් වනතුරු විකිණීමට තබනු ලැබේ.

ස්ටැන්ලි ද සොයිසා,
මුදල් ඇමති තුමා.

1958 අගෝස්තු මස 21 වැනි දින දීය.

---

ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් අප්පුකුට්ටි ආරච්චිගේ එඩ්මන්ඩ් හෙන්ද්‍රික් පෙරේරා මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ දීය.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## වැටුප් සහ සේවක සංඛ්‍යා සංවිධාන කොමිසම

" රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ යොදවා තිබෙන නිලධාරීන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් ද, ප්‍රමාණයට වැඩි ද නැතහොත් අඩු ද " යන්න විභාග කර බැලීමේ දී දැනට සේවයෙහි යෙදී සිටින්නන්ගෙන් නියම ප්‍රයෝජනය කොයි ප්‍රමාණයට ගනු ලැබේද යන්න සලකා බැලීමට කොමිසමට අවශ්‍යයෙන්ම සිදු වී ඇත. රජයේ සේවකයන් දැනට කරන වැඩ ප්‍රමාණය සාර්ථක ලෙස වැඩි කරන්නට නම්, ඊටත් වඩා, කාර්යක්ෂම පරිපාලනයක් ඇති කර ලීමේ වගකීමට රජයේ සියළුම සේවකයන් පරිපූර්ණ අන්දමින් කොටස්කරුවන් වීමට ඔවුන්ට අනුබල දීමට නම්, මහජන සේවා සංස්ථාවේ ද වර්තමාන පරිපාලන සංවිධානයේ ද, රජයේ එදිනෙද වැඩ කටයුතු පිළිවෙළෙහි ද ඇතැම් සංශොධන කීපයක් ඇති කළ යුතු ය යන්න සාමාන්‍යයෙන් කවුරුත් පිළිගෙන තිබෙන බව පෙනී යයි.

2. රජයේ කටයුතු වඩා හොඳින් කරලීමට මහ සැලසෙතැයි ද, ජාතික ශුභ සිද්ධිය ප්‍රගුණ කිරීමෙහි ලා හිතකර වෙතැයි ද සැලකෙන, දැනට අවශ්‍ය වී ඇති එ වැනි සංශෝධනයන් පිළිබඳ ව අදහස් උදහස් හා යෝජනා එවන ලෙස, රජයේ සේවකයින්ට හා රජයේ සේවක සංගම්වලටත්, විශ්‍රාම ලත් රජයේ සේවකයන්ටත්, එ සේම ඒ වැනි සංශොධන ගැන උනන්දුවක් දක්වන මහජනයාටත් කොමිසම ආරාධනා කරයි. එසේ ආරාධනා කිරීමේදී කොමිසමට ඉදිරිපත් කර ඇති පහත දැක්වෙන යෝජනා ගැන ද අවධානය යොමු කරන ලෙස කොමිසම ඉල්ලා සිටී :—

(අ) දැනට එක් අමාත්‍යාංශයක් යටතේ තිබෙන සියලුම දෙපාර්තමේන්තු, ස්ථාවර ලේකම් කෙනෙකුගේ ප්‍රධානත්වයෙන් එකම සම්මිශ්‍ර ඒකකයක් හෙවත් අමාත්‍යාංශයක් වශයෙන් ඒකාබද්ධ කිරීම ; එවිට ඒ දෙපාර්තමේන්තු අමාත්‍යාංශයේ අංශ වශයෙන් ද, දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ස්ථාවර ලේකම් තුමාගේ නියෝජ්‍ය නිලධාරීන් නැතහොත් උප ලේකම් වරුන් වශයෙන් ද ක්‍රියා කරනු ඇත. මෙ සේ කිරීමෙන් පරිපාලන කටයුතු අනවශ්‍ය සේ ද්විගුණ වීම සැලකිය යුතු ප්‍රමාණයකින් වැලැක්වීම ද, වඩා හොඳ පරිපාලන හා මුදල් පාලන කටයුතු ඇතිවීම ද, ඒකකයක් වශයෙන් අමාත්‍යාංශයේ වැඩ කටයුතු වඩාත් සහයෝගයෙන් කරගෙන යෑම පහසුවීම ද සිදු වනු ඇත.

(ආ) රජයේ දෙපාර්තමේන්තුවක පැන නගින යම් ප්‍රශ්නයක් පිළිබඳ ව තීරණයක් ගැනීමේ දී එය බොහෝ දෙනෙකුගේ සැලකිල්ලට භාජනවන්නට සිදු වන සේ දැනට ක්‍රියාවේ යෙදෙන ප්‍රතිපත්තිය නැති කොට, එ වැනි ප්‍රශ්න විසඳීමෙහි ලා නානා මට්ටම්වල දී වගකීම නිශ්චිත වශයෙන් පැවරීම.

(ඇ) රජයේ එදිනෙද කටයුතු ඉක්මන් කරවීම සඳහා, මුදල් හා අනික් කටයුතු සම්බන්ධ රෙකුලාසි සහ කාර්ය පරිපාටිය ලිහිල් කිරීම ; ප්‍රමාදය හේතුවෙන් බලාපොරොත්තු සුන් වූ අවස්ථා ඇතිවී, නිතැතින් ආර්ථික පිරිහීම්වලට මග පැදෙනසුලු, අවශ්‍යසේවා හා සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තු ගැන සලකා බැලීමේදී මෙය විශෙෂයෙන් වැදගත් ය.

(ඈ) දැනට පවත්නා කේන්ද්‍රගත කොට ඇති මුදල් හා පරිපාලන පාලන ලිහිල් කිරීම ; මෙසේ කිරීමෙන් විවිධ තරාතිරම්වල නිලධාරීන්ට ඔවුන්ගේ තරාතිරම්වලට සරිලන අයුරු වගකීම භාරගැනීමට පැවරෙනවා පමණක් නොව, එම වගකීම යෝග්‍ය පරිදි, අප්‍රමාදව, ඉෂ්ටකිරීමට වග බලාගැනීමට ද සිදුවනවා ඇත.

(ඉ) දැනට තිබෙන බහුප්‍රකාර තනතුරු නම් ද, වර්ග ද වැටුප් ක්‍රම ද නැතිකොට වඩා ප්‍රයෝජන ගත හැකි වන්නා වූ ද වඩා සංතුලනාත්මක වූ ද සංස්ථාවක් ඇති කිරීමෙන් රාජ්‍ය සේවාව වඩා යුක්ති සහගත කිරීම.

(ඊ) රජයේ සේවයේ සිටින්නවුන්ගේ දක්ෂකමට හා කාර්‍යක්ෂමතාවයට විශෙෂ අනුබල හා තාන්න මාන්න ලැබෙන අයුරු ක්‍රියා පිළිවෙළක් සකස් කිරීම ; ඒ සමගම නොසැලකිල්ල, කාර්යක්ෂම නොවීම හා වෙනත් අඩුපාඩුකම් සඳහා වඩා ඉක්මණින් ක්‍රියාවේ යෙදවිය හැකි, දඬුවම් දීමේ පිළිවෙලක් ඇති කිරීම.

(උ) දැනට පවතින සැලැස්ම අනුව අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල ද (අ) ඡෙදයේ පෙන්වා ඇති ඒකාබද්ධ අමාත්‍යාංශවල ද, සියලුම තරාතිරම් වල සේවක නියෝජිතයන්ගෙන් යුක්ත වූ ඒකාබද්ධ සාකච්ඡා සභා පිහිටුවීම ; මෙසේ කිරීමෙන් සියලුම රජයේ සේවකයින්ට දෙපාර්තමේන්තුවල එදිනෙද කැරෙන හා සමස්ත වශයෙන් දැක්වෙන වැඩ කටයුතුවලට සහභාගී වන්නට හා වගකීමෙන් බැඳෙන්නට පුළුවන් වෙනවා ඇත.

(ඌ) රජයේ සේවකයන්ගේ රැකීරක්ෂා තත්ත්වය හා කොන්දේසි සම්බන්ධයෙන් පැන නගින ප්‍රශ්න විනිශ්චය කිරීම සඳහා, නොකඩවා රැස්වීම පවත්වන්නාවූ ද නිදහස් ආයතන සේ කටයුතු කළ හැක්කාවූ ද " වැටුප් පිළිබඳ ප්‍රශ්න සමථය කිරීමේ සභා " පිහිටුවීම.

3. මේ කරුණු සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට සතුටු අය සන්දේශ මාර්ගයෙන් එ සේ කළ යුතු බව කරුණාවෙන් සලකන්න. එ ම සන්දේශ වල පිටපත් හය බැගින් එවන්නේ නම් වඩා හොඳය. එ සේ එවන සියලුම සන්දේශ සැප්තැම්බර් 30 වැනිදට හෝ ඊට පෙර හෝ මේ කාර්‍යාලයට ලැබෙන්නට සැලැස්සුවහොත් මැනවි.

සී. නාගලිංගම්,
වැටුප් සහ සේවක සංඛ්‍යා සංවිධාන කොමිසමේ සභාපති.

127, මාකාර්ති පාර,
කොළඹ 7, 1958 අගෝස්තු 21.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.